අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ)

10 සහ 11 ශ්‍රේණි

# සංස්කෘත

## විෂය නිර්දේශය

(2012 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)

විදේශ හා සම්භාව්‍ය භාෂා දෙපාර්තමේන්තුව
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

## 01 විෂය හැඳින්වීම

ලෝකයේ ප්‍රචලිත ව පැවැති හා පවතින සියලු භාෂා ඇතැමුන් විසින් ජීවභාෂා, මෘතභාෂා හා සම්භාව්‍ය භාෂා යනුවෙන් වර්ග ත්‍රයකට බෙදා-දක්වනු ලැබේ. ජීවභාෂා යනු අද්‍යතන ව්‍යවහාරයේ පවතින සිංහල, දෙමළ, ඉංග්‍රීසි, ජර්මන්, ජපන් ආදි භාෂාවෝ ය. මෘතභාෂා හෙවත් මළබස් යනු කලින් ව්‍යවහාරයේ පැවැත, අද ව්‍යවහාරයෙන් ගිලිහී-ගොස් ඇති භාෂා ය. යේසුස් වහන්සේ ව්‍යවහාර කළහ යි සැලැකෙන ඇරමෙයික්, මධ්‍යතන ප්‍රාකෘත භාෂා වූ ශෞරසේනී, අපභ්‍රංශ, ආවන්තී, ප්‍රාච්‍යා ආදිය උදාහරණ ය. බහුතර ජනයා විසින් වැවහර නොකරනු ලබන භාෂා වුව ද, ආගමික හා ශාස්ත්‍රීය අගයකින් යුත් ලතින්, සංස්කෘත හා පාලි වැනි භාෂාවෝ සම්භාව්‍ය භාෂා ගණයට අයත් වෙති.

ලෝකයේ පවත්නා සම්භාව්‍ය භාෂා අතුරින් සංස්කෘතයට හිමි වන්නේ අද්විතීය ස්ථානයෙකි. යුරෝපයේ හා ආසියාවේ ප්‍රචලිත ග්‍රීක හා ලතින් ඇතුළු භාෂා බහුතරයෙක මූලභාෂාව ලෙස සැලැකෙන්නේ සංස්කෘතය යි. එය ඉතා පොහොසත් වාක්කෝශයකින් හා අතිශයින් සංකීර්ණ ව්‍යාකරණයකින් ද සමන්විත අතිප්‍රබල පෞරුෂයක් ඇති භාෂාවකි. ශ්‍රේෂ්ඨ සාහිත්‍යයක් උරුම කොට ඇති එය සංගීතය, නර්තනය, නාට්‍යය, චිත්‍රකලාව, මූර්තිශිල්පය වැනි පෙරදිග කලාවන් මෙන් ම, කාව්‍යශාස්ත්‍රය, වෛද්‍යවිද්‍යාව, පුරාවිද්‍යාව, ආයුර්වේදය, ජ්‍යෝතිශ්ශාස්ත්‍රය වැනි ශාස්ත්‍රීය විෂයයන් සමග ද අත්‍යන්තයෙන් බැඳී-පවතින්නා වූ භාෂාවකි. සිංහලය හා සියලු උත්තර භාරතීය භාෂාවන් හදාරන විද්‍යාර්ථීනට එබස පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් තිබීම ඉතා ප්‍රයෝජනවත් ය. අද ප්‍රචලිත හින්දී, ගුජරාටී, මාරාටී ආදි සියලු භාරතීය භාෂා දොඩන්නවුනට වඩා සංස්කෘත වචන නිවැරැදි ව උච්චාරණය කළ හැක්කේ සිංහල භාෂකයනට ය. සිංහල වාක්කෝශයෙන් සියයට අනූවක් ම සමන්විත ව ඇත්තේ තත්සම ස්වරූපයෙන් භාවිත වන සංස්කෘත වචන හා ඒවායින් බිඳී-ආ තද්භව රූපවලිනි. සංස්කෘතයේ ආධිපත්‍යයට යට වී තුබුණු සිංහලය ඉන් මුදා-ගැනීමට ප්‍රබල සටනක් ගෙන-ගිය කුමාරතුංග මුනිදාසයන් සිංහල ගුරුවරුනට දුන් මුඛ්‍ය උපදේශය නම්, ඔවුන් විසින් පුරාණ භාෂාවක් වශයෙන් සංස්කෘතය අනිවාර්යයෙන් උගත යුතු බව යි. සෙනරත් පරණවිතාන, ආනන්ද කුමාරස්වාමී ආදීන් ලෝපතළ උගතුන් බවට පත් වූයේ ඔවුන් සතු ව තුබූ සංස්කෘත ඥානය නිසා බව අප අමතක නොකළ යුතු ය.

සංස්කෘතය මළබසෙකැ යි කියමින් එබස ඉගැනීම නිෂ්ඵල ව්‍යායාමයෙකැ යි පවසන්නෝ අඥානයෝ ය. සංස්කෘතය කිසි ලෙසෙකිනුත් මළ බසෙක් නො වේ. තව මත් සංස්කෘතයෙන් ග්‍රන්ථ රචනා වෙමින් පවතින අතර, එය මව්බස ලෙස වහරන සුළු පිරිසක් හෝ අද ද භාරතයේ වාසය කරති. ලෝකයේ උසස් යැ යි සම්මත විද්‍යානිකේතනයන් වන ඔක්ස්ෆර්ඩ්. කේම්බ්‍රිජ්, හාර්වර්ඩ්, චිකාගෝ, ජර්මනියේ ගොටින්ජන්, ඕස්ත්‍රේලියානු ජාතික විශ්වවිද්‍යාලය ආදියෙහි සංස්කෘතය සම්භාව්‍ය භාෂාවක් වශයෙන් ඉගැන්වේ. සංස්කෘත භාෂා අධ්‍යයනය අන් කිසිවකුටත් වඩා වැදගත් වනුයේ ශ්‍රීලාංකිකයන් වන අපට ය. එබස හදාරන්නා මනා පෞරුෂයකින් හෙබි, සදාචාරසම්පන්න, පරිපූර්ණ මිනිසකු බවට පත් කිරීමේ ශක්තිය සංස්කෘතය සතු ව ඇත. එහෙයින් අපේ පාසල්වල සංස්කෘතය විෂයයක් වශයෙන් හැදෑරීම දිරිමත් කළ යුතු ව ඇත. විශේෂයෙන් විදුහල්පතිවරු සිය පාසල්වල අ. පො. ස. (සා/පෙළ) සිට හෝ සංස්කෘතය ඉගැන්වීමට පියවර ගන්නෝ නම්, සිසුන් ගේ සිංහල දැනුම ද ඉබේ ම ඉහළ මට්ටමකට පත් වනු ඇත.

## 02 විෂය අධ්‍යයනයේ අරමුණු

01. සිංහල හා සංස්කෘත වර්ණ මාලාව පිළිබඳ ව තුලනාත්මක අධ්‍යයනයකට පෙළඹවීමක් ලැබීම

02. සිංහල භාෂාව නිවැරදි ව භාවිත කිරීමට මූලාධාර වීම

03. ආයුර්වේදය, ජ්‍යෝතිර්විද්‍යාව, නක්ෂත්‍ර ශාස්ත්‍රය වැනි විවිධ ශාස්ත්‍ර, කලා ශිල්ප හා දර්ශනවාද ඉගැනීමේ දී ජීවභාෂාවක් වශයෙන් දැනුම, ආකල්ප, කුශලතා සංවර්ධනයට ශක්තිමත් පදනමක් සැපයීම

04. ඉන්දියානු භාෂා අධ්‍යයනයට අත්වැලක් සැපයීම

05. පුරාණ ඥාන ගවේෂණය සඳහා උපකාරී වීම

06. වාග්විද්‍යාත්මක භාෂා ගවේෂණයට හා පාරිභාෂික ශබ්දමාලා සම්පාදනයට මූලාධාර වීම

07. සාහිත්‍ය රසාස්වාදයට රුකුලක් වීම

08. හරධර්ම චරිතායනයට සහාය වීම

09. තොරතුරු තාක්ෂණය සඳහා විධිමත් භාෂා මාධ්‍යයක් ගොඩනැගීමට මූලාධාර වීම

10. විශ්වීය කේත (Universal code) ක්‍රමයකට අවශ්‍ය විද්‍යාත්මක භාෂා අධ්‍යයනය සඳහා රුකුලක් වීම

11. හින්දු ස්තෝත්‍ර -හා බෞද්ධ සංස්කෘත ශ්ලෝක, සංස්කෘත භාෂාවෙන් ලියැවී ඇති බැවින් ශ්‍රී ලංකාවේ ජාතික හා ආගමික සමගියට අවශ්‍ය දායකත්වය ලබාදීම

## අ.පො.ස (සාමාන්‍ය පෙළ) සංස්කෘත විෂය

### විෂය නිර්දේශය පාසල් වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලැස්ම

| ශ්‍රේණිය | වාරය | නිපුණතා මට්ටම් | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|
| 10 | I | 1.1, 1.2, 1.3, 1.4, 1.5, 2.1, 2.2, 2.3, 2.4, 3.1, 3.2, 7.1, | 30 |
| | II | 7.2, 7.3, 3.3, 4.1, 4.2, | 30 |
| | III | 4.3, 4.4, 5.1, 5.2, 5.3, 5.4, 6.1, 6.2, 8.1, 8.2, 8.3, | 30 |
| 11 | I | 1.1, 1.2, 1.3, 1.4, 7.1, 7.2, 7.3, 2.1, 2.2, 2.3, 2.4, | 30 |
| | II | 2.5, 3.1, 3.2, 3.3, 3.4, 3.5, 3.6, 4.1, 4.2, | 30 |
| | III | 4.3, 4.4, 5.1, 5.2, 5.3, 6.1, 6.2, 6.3, 6.4, 6.5, 8.1, 8.2, 8.3 | 30 |

## 3.0 අ.පො.ස (සාමාන්‍ය පෙළ) සංස්කෘත විෂය නිර්දේශය

**10 ශ්‍රේණිය**

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | අභිමත නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01. සංස්කෘත අක්ෂර මාලාව නිවැරදි ව කියවීමට හා ලිවීමට හැකියාව ලබයි. | 1.1 දේවනාගරි අක්ෂර මාලාව නිවැරදි ව කියවයි.<br>1.2 දේවනාගරි අක්ෂර මාලාව නිවැරදි ව ලියයි.<br>1.3 පිලි සහ පිල්ලම් එක් එක් අකුරට නිවැරදි ව යොදා ලියයි.<br>1.4 සංයුක්තාක්ෂර නිවැරදි ව කියයි; නිවැරදි ව ලියයි.<br>1.5 දේවනාගරි අක්ෂරයෙන් ලියූ සරල වාක්‍ය සාමාන්‍ය වේගයෙන් කියවයි. | 1.5.1 දේවනාගරී අක්ෂරයෙන් ලියූ සරල සංස්කෘත වාක්‍යයන් නිවැරදි ව කියවයි. | • සංස්කෘත අක්ෂර මාලාව මාතෘ භාෂාමය අක්ෂරයෙන් ලිවීම හා ඒවායේ ස්වර ව්‍යඤ්ජන වෙන් වෙන් ව හඳුන්වා දීම.<br>• ව්‍යඤ්ජන අක්ෂරවලට පිලි යොදා ලිවීමට හුරු කිරීම.<br>• අකුරු අඩු වචන පිලි හා පිල්ලම් සමග ලියවීම.<br>• ඉහළ සිට පහළටත්, වම සිට දකුණටත් සංයුක්තාක්ෂර නිර්මාණය වීම ඉගෙනීම හා ආවේණික සංයුක්තාක්ෂර හඳුනා ගැනීම.<br>• සරල වාක්‍ය නිශ්චිත වේලාවක් තුළ කියවීම. | 05<br>01<br>01<br>02<br>02 |
| 02. උක්තාඛ්‍යාත පද සම්බන්ධය සහිත පූර්ණ වාක්‍යයක් නිවැරදි ව ගොඩනැගීමට හා එබඳු වාක්‍යයන් නිවැරදි ව පරිවර්තනය කිරීමට හැකියාව ලබයි. | 2.1 ඒකවචන, ද්විවචන, බහුවචන, භේදය හඳුනාගනියි.<br>2.2 ලිංග අනුව ඒ ඒ නාම පදයන් හා ඒ ඒ වචන භේදයන් වටහාගනියි.<br>2.3 උක්ත, කර්ම, ආඛ්‍යාත සහිත වාක්‍යයන් ගොඩනගයි.<br>2.4 උක්ත, කර්ම, ආඛ්‍යාත සහිත වාක්‍යයක තේරුම නිවැරදි ව කියයි. | 2.1.1 උක්ත, කර්ම,ආඛ්‍යාත සහිත අර්ථවත් සරල වාක්‍ය නිර්මාණය කරයි. | • ප්‍රථමා විභක්ති බහුවචන හා අනතුරුව ද්විවචන, ලට් ආඛ්‍යාතය සමග පැහැදිලි කරදීම.<br>• ස්ත්‍රී ලිංග උක්තයන්ගේ වෙනස හඳුන්වා ඒවායෙහි ආඛ්‍යාතමය වෙනසක් නැති බව පැහැදිලි කිරීම හා නපුංසක ලිංග උක්තයන් අනෙක් ලිංග නාමයන්ට වඩා වෙනස් වන අයුරු පැහැදිලි කරදීම, ආඛ්‍යාත පදය ලිංග අනුව වෙනස් නොවන බව පෙන්වාදීම.<br>• මාතෘ භාෂාවට සමීප වචන ප්‍රථමා විභක්ති ඒක වචනයෙහි වරනගා උක්තය හඳුන්වාදීම (කුමාරඃ, ගජඃ ආදි වශයෙනි).<br>• මාතෘ භාෂාවට සමීප ක්‍රියාපද ලට් පරස්මෛපද ප්‍රථම පුරුෂ ඒක වචනයෙහි වරනගා ඉහත කී උක්තයන්ට යෙදීම (ක්‍රීඩති, පතති ආදි වශයෙනි). | 02<br>02<br>02<br>02 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | අභිමත නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 03. සංස්කෘත භාෂාවේ සරල ව්‍යාකරණ අංග නිර්මාණය කිරීමේ හා එබඳු ව්‍යාකරණ අංග තේරුම් ගැනීමේ හැකියාව ලබයි. | 3.1 නාමපදයක් විභක්ති හතෙහි වෙනස් ව වරනගන අයුරු වටහාගනියි.<br><br>3.2 විභක්තිගත නාම පදයක විභක්ත්‍යර්ථය නිවැරදි ව ප්‍රකාශ කරයි.<br><br>3.3 ගමනාර්ථයේ ද්විතීයා, සාර්ධම් යෝගයෙහි තෘතීයා, පිණිස, නිසා යන අර්ථයන්හි චතුර්ථී විභක්තිය හා සප්තමී විභක්ති ප්‍රයෝග ද හඳුනාගනියි.<br><br>3.4 විභක්ති අර්ථ සහිත මාතෘභාෂාගත වාක්‍ය සංස්කෘතයට නගයි.<br><br>3.5 ලට්, ලෝට්, ලඞ්, ලෘට් යන ලකාරයන්හි පරස්මෛපද ආඛ්‍යාත රූප නිවැරදි ව වරනගයි.<br><br>3.6 ඉහත කී ලකාරයන්හි වරනැගෙන ආඛ්‍යාත පදවල වචන හා පුරුෂ භේදය නිවැරදි ව හඳුනාගෙන තේරුම කියයි. | 3.6.1 නාමපද හා ආඛ්‍යාත පද නිවැරදි ව වරනගා තේරුම කියයි. | • අභ්‍යාස මගින් විභක්තිගත නාමපදයන්හි අර්ථ වෙනස්කම් පිළිබඳ දැනුම ලබා දීම හා විභක්ත්‍යර්ථ විස්තර කරදීම.<br>• විභක්තිගත නාමපද එක් කිරීම මගින් වාක්‍ය පුළුල් කිරීමට හුරු කරවීම.<br>• විභක්ති ප්‍රයෝග හඳුන්වාදීම<br>• ඒ ඒ විභක්තිගත නාමපද හා ඒ, ඒ ලකාර ගත ආඛ්‍යාත පද එක් කොට වාක්‍ය තැනීමට හුරු කිරීම.<br>• ලට්, ලෝට්, ලඞ්, ලෘට් යන ලකාරයන්හි පරස්මෛපද ප්‍රත්‍ය වනපොත් කැරැවීම හා ඒවා යොදා ආඛ්‍යාත රූප නිර්මාණය කැරැවීම.<br>• වරනැගෙන ඉහත ලකාර රූපවල අර්ථමය වෙනස්කම් අභ්‍යාස මගින් වටහාගැනීමට ඉඩහැරීම. | 03<br>03<br>03<br>05<br>06<br>02 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | අභිමත නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 04. සරල සංස්කෘත වාක්‍ය හා ගද්‍ය පද්‍ය කොටස් සංස්කෘතයෙන් මව්බසට ද, මව්බසින් සංස්කෘතයට ද, නිවැරදි ව පරිවර්තනය කිරීමේ හැකියාව ලබයි. | 4.1 උක්තය සහ වර්තමාන කාල ආඛ්‍යාතය පමණක් සහිත වාක්‍ය භාෂාන්තරයන්ට පරිවර්තනය කරයි.<br>4.2 ප්‍රථමා, ද්විතීයා, තෘතීයා, චතුර්ථී, පඤ්චමී, ෂෂ්ඨී, සප්තමී විභක්තිගත නාමපද හා විභක්ති ප්‍රයෝග හඳුනාගෙන භාෂාන්තරයන්ට පරිවර්තනය කරයි.<br>4.3 ලෝට් ලකාරය සහ ලෘට් ලකාරයේ ක්‍රියාපද සහිත වාක්‍ය නිර්මාණය කරයි<br>4.4 තුනට වැඩි හයට අඩු වචන ප්‍රමාණයක් සහිත වාක්‍ය සංස්කෘතයෙන් නිර්මාණය කරයි. | 4.5.1 සරල ඡේදයක් මව් බසින් සංස්කෘතයටත්, සංස්කෘතයෙන් මව් බසටත් පරිවර්තනය කරයි. | • සරල සංස්කෘත ශික්ෂකය 1 කොටස (අතිපූජ්‍ය බලන්ගොඩ ආනන්ද මෛත්‍රේය නාහිමි) ග්‍රන්ථයේ 01 සිට 15 දක්වා පාඩම්වල අභ්‍යාස කරවීම.<br>• බාලාදර්ශය 01 සිට 05 දක්වා පාඩම් ඉගැන්වීම. | 15<br>05 |
| 05. නිර්දිෂ්ට ග්‍රන්ථ හඬනගා නිවැරදි ව කියැවීම, දේවනාගරී අක්ෂරයෙන් ලිවීම, වනපොත් කිරීම, අර්ථ විවරණය කිරීම පිළිබඳ හැකියාව ලබාගනියි. | 5.1 බුද්ධගද්‍යය, නාමාෂ්ටශතකය, ව්‍යාසකාරය යන සරල සංස්කෘත ග්‍රන්ථ කියැවීමේ හැකියාව ලබයි.<br>5.2 එම ග්‍රන්ථ ලයාන්විත ව සජ්ඣායනා කරයි.<br>5.3 ව්‍යාසකාරයෙහි අන්තර්ගත ශ්ලෝක වලින් තෝරාගත් කොටස් කටපාඩමින් කියයි.<br>5.4 තෝරාගත් ශ්ලෝක නිවැරදි ව දේවනාගරී අක්ෂරයෙන් ලියයි. | 5.1.1 සංස්කෘතයෙන් ලියැවී ඇති සරල සම්භාව්‍ය ග්‍රන්ථ කියවයි. | • බුද්ධගද්‍යය මුල් ශ්ලෝක 05 කියවීමට හුරු කරවීම, සජ්ඣායනාවට හුරු කරවීම.<br>• නාමාෂ්ටශතකයේ මුල් ශ්ලෝක පහ (05) කියවීමට හුරු කරවීම, සජ්ඣායනාවට හුරු කරවීම.<br>• ව්‍යාසකාරයෙහි පහත දැක්වෙන ශ්ලෝක 05 වනපොත් කිරීම, අර්ථ කීමේ හැකියාව, දේවනාගරී අක්ෂරයෙන් ලිවීම.<br>(1 සාධොඃ පරුෂවාක්‍යෛශ්ච....)<br>(2 දේයානි තෘණපර්ණානි ....)<br>(3 කණ්ඨකානං බලානාං ච ....)<br>(4 ජලබිංදු නිපාතෙන ....)<br>(5 අත්‍යල්පමපි සාධූනං ....) | 02<br>03<br>04 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | අභිමත නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 06. සංස්කෘත සාහිත්‍ය ඉතිහාසයේ අශ්වඝෝෂ, කාලිදාස යන කවීන් සහ ඛණ්ඩ කාව්‍ය යන මාතෘකා පිළිබඳ ව හැඳින්වීමක් කිරීමේ හැකියාව ලබයි. | 6.1 අශ්වඝෝෂ හිමි හා මහා කවි කාලිදාස යන දෙදෙනා පිළිබඳ මූලික දැනුමක් ලබයි.<br>6.2 ඛණ්ඩ කාව්‍යයන් වන ඍතුසංහාරය හා මේඝදූතය පිළිබඳ සාමාන්‍ය අවබෝධයක් ලබයි. | 6.1.1 සංස්කෘත සාහිත්‍ය ඉතිහාසයේ මහා කවීන් දෙදෙනකු පිළිබඳ මූලික අවබෝධයක් ලබයි. | • සංස්කෘත කාව්‍ය සාහිත්‍යය (ජයදේව තිලකසිරි) ග්‍රන්ථය ආශ්‍රයෙන් කාව්‍ය සාහිත්‍ය පිළිබඳ සරල අවබෝධයක් ලබාදීම.<br>• අශ්වඝෝෂ හිමි, මහාකවි කාලිදාස.<br>• මේඝදූතය, ඍතුසංහාරය. | 01<br>02<br>02 |
| 07. නියමිත නාම වරනැගිලි කටපාඩමින් කීමේ හැකියාව ලබාගනී. | 7.1 අකාරාන්ත, ඉකාරාන්ත, උකාරාන්ත, පුරුෂ ලිංගික නාම පද වරනැගිලි නිවැරදි ව වරනගා කටපාඩමින් කියයි.<br>7.2 ආකාරාන්ත, ඉකාරාන්ත, උකාරාන්ත ස්ත්‍රී ලිංගික නාමපද වරනැගිලි නිවැරදි ව වරනගා කටපාඩමින් කියයි.<br>7.3 අකාරාන්ත, නපුංසක ලිංගික වරනැගිලි කටපාඩමින් කිය යි. | 7.3.1 පුරුෂලිංග, ස්ත්‍රීලිංග, නපුංසකලිංග නාම වරනැගිලි කටපාඩමින් කියයි. | • සංස්කෘත නාම වරනැගිල්ලෙහි කුමාර, කවි, ගුරු, මාලා, මති, ධෙනු, ඵල යන ශබ්ද වරනැගිලි කටපාඩම් ගැනීම හා වාක්‍යයෙන් ලියන්නට හුරු කිරීම, ඒ ඒ පදවල වචනාන්තර පරිවර්තනය හුරු කරවීම. | 11 |
| 08. ගීතගෝවින්දය සහ නූතනයේ නිර්මිත සංස්කෘත ගීත ගායනය කිරීමේ හැකියාව ලබයි. | 8.1 සරස්වතී ප්‍රශස්තිය ගායනය කරයි.<br>8.2 ගීතගෝවින්දාගත සංස්කෘත ගීත හා නූතන සංස්කෘත ගීත ගායනය කරයි. | 8.2.1 සංස්කෘත ගීත ගායනය කරයි. | • සරස්වතී ප්‍රශස්තිය, මනරංජන දර්ශනීය ලංකා, පුෂ්පයෙන් මනරංජිත වේ, යන ගීත ගායනා කරවීම.<br>• ගීතගෝවින්දයේ ඇතුළත් රතිසුඛසාරේ, චන්දනචර්චිත, පශ්‍යති දිසි දිසි රහසි භවන්තම් ගීත ගායනය කිරීම හා අහං විහංගො විහංගමො'හං, පරමප්‍රභූනා භජනීයං යන නූතන සංස්කෘත ගීත ගායනා කිරීම. | 02<br>03 |

## 11 ශ්‍රේණිය

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | අභිමත නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01. සංස්කෘත අක්ෂර මාලාව නිවැරදි ව කියැවීමට හා ලිවීමට හැකියාව ලබයි. | 1.1 සංයුක්තාක්ෂර නිවැරදි ව ලියයි.<br>1.2 සංයුක්තාක්ෂර නිවැරදි ව කියවයි.<br>1.3 දේවනාගරී අක්ෂරයෙන් ලියූ සරල ඡේද සාමාන්‍ය වේගයෙන් කියවයි.<br>1.4 ස්වර, ව්‍යඤ්ජන, හ්‍රස්ව දීර්ඝ, වර්ගාක්ෂර, අන්තඃස්ථාක්ෂර, ඌෂ්මාක්ෂර අනුස්වාරය, විසර්ගය වෙන් වෙන් ව ප්‍රකාශ කරයි. | 1.3.1 සංයුක්තාක්ෂර සහිත සංස්කෘත ඡේද නිවැරදි ව කියවයි. | • සංයුක්තාක්ෂර සහිත සිංහල ඡේදයක් සිංහලයෙන් නිවැරදි ව ලිවීමට හුරු කරවීම.<br>• එම සිංහල ඡේද දේවනාගරී අක්ෂරයෙන් ලියැවීම.<br>• සමාන අකුරු බැඳෙන අයුරු පෙන්වාදීම (මම) (म्म) වැනි සිරස් අතට එකතු වන සංයුක්තාක්ෂර, කක (क्क) වැනි යටට එකතු වන සංයුක්තාක්ෂර, ඤ්ච (ञ्च) නන (न्न) වැනි එක් න්‍යෂ්ටියක එකට එකතු වන සංයුක්තාක්ෂර ක්ෂ ( क्ष ) වැනි විශේෂ සංයුක්තාක්ෂර වෙන වෙන ම ඉගැන්විය යුතු යි.)<br>• සංයුක්තාක්ෂර සහිත දේවනාගරී ඡේදයක් නිශ්චිත වේලාවක දී කියැවීම.<br>• ඉගෙනුම් උපකරණ ආශ්‍රයෙන් ශිෂ්‍යයා ලවා අක්ෂර මාලාව බෙදා දැක්වීම.<br>• අක්ෂර වර්ගීකරණය අභ්‍යාස මගින් හුරුකරවීම. | 01<br>01<br>01<br>02<br>01<br>01 |
| 02. උක්තාඛ්‍යාත පද සම්බන්ධය සහිත පූර්ණ වාක්‍යයක් නිවැරදි ව ගොඩනැගීමට හා එබඳු වාක්‍ය නිවැරදි ව පරිවර්තනය කිරීමට හැකියාව ලබයි. | 2.1 ඒකවචන, ද්විවචන, බහුවචන, භේදය හඳුනාගනියි.<br>2.2 ලිංග අනුව ඒ, ඒ නාමපද හා ඒ ඒ වචන භේද වටහාගනියි.<br>2.3 උක්ත, කර්ම, ආඛ්‍යාත සහිත වාක්‍ය ගොඩනගයි.<br>2.4 උක්ත, කර්ම, ආඛ්‍යාත සහිත වාක්‍යයක තේරුම නිවැරදි ව කියයි.<br>2.5 පූර්වක්‍රියා, තුමන්තක්‍රියා, අතීතකාල කෘදන්ත, වර්තමානකාල කෘදන්ත, අනාගතකාල කෘදන්ත පදයන්ගේ ව්‍යූහය ඉතා සරළ ලෙෂ හා සුගම ලෙස හඳුනාගනියි. | 2.4.1 සංස්කෘත භාෂාවෙන් පුළුල් ව වාක්‍ය නිර්මාණය කරයි. | • නාමපදයන්ගේ ලිංගභේදය හා වචන භේදයන් ඉගැනීම, ආඛ්‍යාතයන්ගේ පුරුෂභේදය හා වචන භේදයන් ඉගැනීම.<br>• නාමපදයක් වරනැගීමෙහි හැකියාව වර්ධනය කරවීම හා අර්ථ පැහැදිලි කරවීම, පුළුල් ව වාක්‍ය නිර්මාණය කරවීම.<br>• මධ්‍යම හා උත්තම පුරුෂ ආඛ්‍යාත ප්‍රයෝග හා ඊට සරිලන උක්තයන්ගේ ප්‍රයෝග හඳුන්වාදීම හා ලෝට්, ලෘට්, ලඞ්, ලිට් යන ලකාර ඉහත කී උක්තයන් සමග වෙනස් ව වරනැගෙන අයුරු අභ්‍යාස ආශ්‍රයෙන් හුරු කරවීම.<br>• පූර්වක්‍රියා, තුමන්තක්‍රියා හා කාල කෘදන්ත ප්‍රයෝග වාක්‍යයන්හි යෙදෙන අයුරු අභ්‍යාස මගින් හුරු කරවීම. මෙහිදී ශිෂ්‍යයාට මූලික දැනුමක් පමණක් ලබාදීම ප්‍රමාණවත් ය. | 04<br>04<br>04<br>08 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | අභිමත නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 03. සංස්කෘත භාෂාවේ සරල ව්‍යාකරණ අංග නිර්මාණය කිරීම හා එබඳු ව්‍යාකරණ අංග තේරුම් ගැනීමේ හැකියාව ලබයි. | 3.1 ගමනාර්ථයේ ද්විතීයා සාර්ධම් යෝගයේ තෘතීයා පිණිසාර්ථයේ චතුර්ථී කාලාර්ථයේ සප්තමී ආදි විභක්ති ප්‍රයෝග හඳුනාගනී.<br>3.2 ඉහත විභක්ති අර්ථයන් සහිත සිංහල වාක්‍ය සංස්කෘතයට නගයි.<br>3.3 ලට්, ලෝට්, ලඞ්, ලිට්, ලෘට් යන ලකාරයන්හි පරස්මෛපද ආඛ්‍යාත රූප නිවැරදි ව වරනගයි.<br>3.4 ඉහත කී ලකාරයන්හි වරනැගෙන ආඛ්‍යාත පදවල වචන හා පුරුෂ භේදය හඳුනාගෙන නිවැරදි ව තේරුම කියයි.<br>3.5 වාක්‍යයක ආඛ්‍යාතය ලකාරයෙන් ලකාරයට වෙනස් කිරීමේ හැකියාව ඇති කරගනී.<br>3.6 ආඛ්‍යාත පදය පුරුෂයෙන් පුරුෂයට හා වචනයෙන් වචනයට වෙනස් කරමින් ඊට අනුරූපී ව සෙසු රූප ද වෙනස් කරමින් නිවැරදි වාක්‍ය ගොඩනගයි. | 3.7.1 සංස්කෘත භාෂාවේ සරල ව්‍යාකරණාංග හඳුනාගනියි. | • ගමනාර්ථයේ ද්විතීයා, සාර්ධම් යෝගයේ තෘතීයා, පිණිසාර්ථයේ චතුර්ථී කාලාර්ථයේ සප්තමී ආදි විභක්ති ප්‍රයෝග සහිත වාක්‍ය තැනීමට හුරු කරවීම හා එම වාක්‍යයන්හි විභක්ති ප්‍රයෝග සහිත වාක්‍ය භාෂාන්තරයන්ට පරිවර්තනය කිරීම.<br>• ලට්, ලෝට්, ලඞ්, ලිට්, ලෘට් යන ලකාරයන්හි පරස්මෛපද ආඛ්‍යාත රූප නිවැරදි ව වරනැගීම හා ආඛ්‍යාතපදවල වචන, පුරුෂ භේදය හඳුනාගෙන තේරුම කීම.<br>• වාක්‍යයක ආඛ්‍යාතය ලකාරයෙන් ලකාරයට හා පුරුෂයෙන් පුරුෂයට වෙනස් කරමින් නිවැරදි වාක්‍ය නිර්මාණය කිරීම, ඒවායේ අර්ථ කීම. | 03<br>06<br>04 |
| 04. සරල සංස්කෘත වාක්‍ය හා ගද්‍යපද්‍ය ඡේද සංස්කෘතයෙන් මව්බසට ද මව්බසින් සංස්කෘතයට ද නිවැරදි ව පරිවර්තනය කරයි. | 4.1 සරල සංස්කෘත ඡේද සංස්කෘතයෙන් මව් බසට පරිවර්තනය කරයි.<br>4.2 සරල මාතෘ භාෂාමය වාක්‍ය සංස්කෘතයට පරිවර්තනය කරයි.<br>4.3 සරල මාතෘකා යටතේ, වාක්‍ය දහයකට අඩු රචනා නිර්මාණ කරයි.<br>4.4 සරල පද්‍ය සංස්කෘතයෙන් මාතෘ භාෂාවට පරිවර්තනය කරයි. | 4.3.1 සංස්කෘත භාෂාවෙන් සරල රචනා නිර්මාණය කරයි. | • සරල සංස්කෘත ශික්ෂකය - 1 (අතිපූජ්‍ය බලන්ගොඩ ආනන්ද මෛත්‍රේය නාහිමි) ග්‍රන්ථයේ 16 සිට අවසානය දක්වා පාඩම්හි අභ්‍යාස පරිවර්තනය කරවීම.<br>• බාලාදර්ශය 06 සිට 10 දක්වා පාඩම් ඉගැන්වීම. | 15<br>05 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | අභිමත නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 05. නිර්දිෂ්ට ග්‍රන්ථ හඬනගා නිවැරදි ව කියැවීම, දේවනාගරී අක්ෂරයෙන් ලිවීම, අර්ථය තේරුම් ගැනීම, අර්ථ විවරණය කිරීම, වනපොත් කිරීම පිළිබඳ හැකියාව ලබාගනියි. | 5.1 බුද්ධගද්‍යය, නාමාෂ්ටශතකය, ව්‍යාසකාරය යන සරල සංස්කෘත ග්‍රන්ථ කියැවීමේ හැකියාව ලබයි.<br>5.2 එම ග්‍රන්ථවල අන්තර්ගත ශ්ලෝකවලින් තෝරාගත් කොටස් කටපාඩමින් කියයි.<br>5.3 ව්‍යාසකාරයෙන් තෝරාගත් ශ්ලෝකයන්හි අර්ථ විවරණය කරයි. | 5.1.1 සරල සංස්කෘත ග්‍රන්ථ කියවා තේරුම් ගනියි. | • ව්‍යාසකාරයෙහි පහත සඳහන් ශ්ලෝක පහ වනපොත් කරවීම හා අර්ථ කීමේ හැකියාව ඇති කිරීම.<br>(1 දුර්භික්‍ෂෙචාන්නදාතාරං....)<br>(2 නාස්ති විද්‍යාසමං....)<br>(3 රූපයෞවනසම්පන්නා....)<br>(4 කාව්‍යශාස්ත්‍රවිනෝදෙන....)<br>(5 භුක්ත්වා නිසීදතඃ ස්තෞල්‍යං....)<br><br>• බුද්ධගද්‍යය, නාමෂ්ටශතකය හා ව්‍යාසකාරය යන ග්‍රන්ථයන්හි තෝරාගත් කොටස් නිවැරදි ව දේවනාගාරී අක්ෂරයෙන් ලිවීමට හුරු කරවීම. | 05<br><br><br><br><br><br><br><br><br>03 |
| 06. සංස්කෘත සාහිත්‍යය ඉතිහාසයේ වෛදික යුගය, අශ්වඝෝෂ මහාකවියා, කාලිදාස මහා කවියා, ඛණ්ඩ කාව්‍ය යන මාතෘකා පිළිබඳ ව හැඳින්වීමක් කිරීමේ හැකියාව ලබයි. | 6.1 වෛදික සාහිත්‍යයේ අන්තර්ගතය සැකෙවින් කීමේ හැකියාව ලබයි.<br>6.2 අශ්වඝෝෂ මහා කවියාගේ කාලය, ජීවන තොරතුරු, කෘති පිළිබඳ කෙටි හැඳින්වීමක් කිරීමේ හැකියාව ලබයි.<br>6.3 කාලිදාස මහා කවියාගේ කාලය, ජීවන තොරතුරු, කෘති පිළිබඳ කෙටි හැඳින්වීමක් කිරීමේ හැකියාව ලබයි.<br>6.4 ඛණ්ඩ කාව්‍ය හා ඒවායේ අන්තර්ගතයන් හඳුනාගෙන ශතක ග්‍රන්ථ පිළිබඳ සංක්ෂිප්ත හැඳින්වීමක් කිරීමේ හැකියාව ලබයි.<br>6.5 හිතෝපදේශය, පඤ්චතන්ත්‍රය යන ග්‍රන්ථ පිළිබඳ ව සරල දැනුමක් ලබාගනියි. | 6.4.1 වෛදික සාහිත්‍යය, ලෞකික සංස්කෘත සාහිත්‍යය හා ඛණ්ඩ කාව්‍යයන් පිළිබඳ සරල අවබෝධයක් ලබයි. | • වෛදික සාහිත්‍යයේ අන්තර්ගතය කෙටියෙන් ඉගැන්වීම (වෛදික සාහිත්‍යය - ජයදේව තිලකසිරි).<br><br>• සංස්කෘත කාව්‍ය සාහිත්‍ය (ජයදේව තිලකසිරි) ග්‍රන්ථය ආශ්‍රයෙන් අශ්වඝෝෂ මහාකවියා, කාලිදාස මහාකවියා හා උපදේශාත්මක ග්‍රන්ථ යන පාඩම් ඉගැන්වීම.<br><br>• ඛණ්ඩ කාව්‍ය හා එවායෙහි අන්තර්ගතයන් හඳුනාගැනීම, හිතෝපදේශය, පඤ්චතන්ත්‍රය පිළිබඳ සරල දැනුමක් ලැබීම. | 01<br><br><br><br>02<br><br><br><br><br>03 |

| නිපුණතාව | ශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම | අභිමත නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 07. නියමිත නාම වරනැගිලි කටපාඩමින් කීම සහ ඒවායේ තේරුම කීමේ හැකියාව ලබාගනී. | 7.1 අකාරාන්ත, ඉකාරාන්ත, උකාරාන්ත, ඍකාරාන්ත පුරුෂ ලිංග නාමපද වරනැගිලි තේරුම් සහිත ව කටපාඩමින් කියයි.<br><br>7.2 ආකාරාන්ත, ඉකාරාන්ත, උකාරාන්ත, ඍකාරාන්ත ස්ත්‍රී ලිංග නාමපද වරනැගිලි තේරුම් සහිත ව කටපාඩමින් කියයි.<br><br>7.3 අකාරාන්ත, ඉකාරාන්ත, උකාරාන්ත, නපුංසක ලිංගික වරනැගිලි තේරුම් සහිත ව කටපාඩමින් කියයි. | 7.1.1 ලිංගත්‍රයට අයත් සංස්කෘත නාමපද වරනගා තේරුම කියයි. | • සංස්කෘත නාම වරනැගිල්ලෙහි 10 ශ්‍රේණියට නියමිත වරනැගිලි හා එබඳු වෙනත් වරනැගිලි කටපාඩම් ගැනීම, මතකයෙන් ලියන්නට හුරු කිරීම.<br><br>• ඒ ඒ පදවල වචනාන්තර පරිවර්තනය හුරු කරවීම. | 08<br><br>04 |
| 08. භෞතික සම්පත් සංස්කෘතයෙන් නාමකරණය කිරීම හා සංස්කෘත භාෂාව ප්‍රායෝගික ව භාවිත කිරීමේ හැකියාව ලබයි. | 8.1 පාසලේ, පිරිවෙණේ, පදිංචි ස්ථානයේ සහ වෙනත් ස්ථානවල ගොඩනැගිලි, වෘක්ෂලතා, ගෘහෝපකරණ, සතුන් සංස්කෘතයෙන් නම් කරයි.<br><br>8.2 සංස්කෘත සදුපදේශ ප්‍රායෝගික ජීවිතයේ දී භාවිත කරයි.<br><br>8.3 ප්‍රායෝගික ජීවිතයේ දී සංස්කෘත භාෂාවෙන් කෙටි සංවාද පවත්වයි. | 8.3.1 සංස්කෘත භාෂාවෙන් සරල සංවාද පවත්වයි. | • ආධ්‍යාපනික ස්ථානයේ සහ පදිංචි ස්ථානයේ උපකරණ, වෘක්ෂලතා, සත්ත්වයන්, අංගප්‍රත්‍යංග සංස්කෘතයෙන් නම් කිරීම.<br><br>• ඔවුනොවුන් කතාබහ කිරීමේ දී සුබ පැතීම්, කෙටි ආමන්ත්‍රණ ආදියේ දී සංස්කෘත උක්තීන් භාවිත කරවීම.<br><br>• ශිෂ්‍ය සමිතියෙහි හා වෙනත් මහජන ඇමැතුම්වල දී සංස්කෘතයෙන් ම හෝ උද්ධෘතයන් ආශ්‍රයෙන් කතා පැවැත්වීමට හුරු කරවීම. | 02<br><br>01<br><br>01 |

## නිර්දිෂ්ට ග්‍රන්ථ

01. නාමෂ්ටශතකය
02. බුද්ධගද්‍යය
03. ව්‍යාසකාරය
04. බාලාදර්ශය
05. සරල සංස්කෘත ශික්ෂකය - 1 (අතිපූජ්‍ය බලන්ගොඩ ආනන්ද මෛත්‍රේය නාහිමි)
06. සංස්කෘත ව්‍යාකරණ ප්‍රවේශය - 1 (ප්‍රාචී අධ්‍යාපන ආයතනය)
07. සංස්කෘත නාමාඛ්‍යාත වරනැගිල්ල
08. වෛදික සාහිත්‍යය - (ජයදේව තිලකසිරි)
09. සංස්කෘත කාව්‍ය සාහිත්‍යය - (ජයදේව තිලකසිරි)

## ආශ්‍රිත ග්‍රන්ථ

01. සුරභාරති - (ඩබ්ලිව්.එස්. කරුණාතිලක)
02. භාෂණසංස්කෘතම් - (සංස්කෘතයෙන් කථා කරමු) (පූජ්‍ය උඩවෙල රේවත හිමි)
03. ගීතකෞමුදී - (පූජ්‍ය උඩවෙල රේවත හිමි)
04. සංස්කෘත අකුරු ලියමු 1 (සංයුක්ත තැටි 2 සමග) ප්‍රාචී අධ්‍යාපන ආයතනය

## 4.0 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

ශ්‍රී ලංකාව තුළ සංස්කෘත භාෂාව දිගු කලක පටන් පරපුරෙන් පරපුරට පැවත එයි. ජේතවනාරාම සංස්කෘත සෙල්ලිපිය නමින් ප්‍රකට ව ඇති අභයගිරි සංස්කෘත සෙල්ලිපිය අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වන්නේ ශ්‍රී ලාංකික ජනසමාජය තුළ සංස්කෘත භාෂාව සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් ද භාවිත වූ බවයි. සිංහල භාෂා-සාහිත්‍ය වෙත සුවිශාල ආභාෂයක් සපයා ඇති සංස්කෘතය දෙමළ භාෂා-සාහිත්‍යය වෙත ද එබඳු ම ආභාසයක් සපයා ඇත. "සර්ව භාෂාසු යා ශ්‍රේෂ්ඨා .... " ආදි හැඳින්වීම්වලට අනුව සංස්කෘතය සියලු භාෂාවන් අතර ශ්‍රේෂ්ඨතම වූත්, සියලු ශාස්ත්‍ර සමුහයන්ගෙන් ආඪ්‍ය වූත්, අංග සම්පූර්ණ භාෂාවකි. සිංහල හෝ දෙමළ මව්බස කොට ඇති ශිෂ්‍යයාට ඊට වෙනස් වූ අක්ෂර රටාවක් වෙත යොමු වෙමින් හෝඩිය වශයෙන් ඉඳුරා වෙනස් නොවූව ද විෂමතා හඳුනාගනිමින් හැදෑරිය යුතු සංස්කෘතය ශිෂ්‍යයන් අතර ප්‍රියශීලි විෂයයක් බවට පත් කිරීමටත් එම විෂය ඉගෙනීම සඳහා ඔවුන් පෙළඹවීමටත් භාෂාව පහසුවෙන් ඉගෙනීමේ සාම්ප්‍රදායික විධි ක්‍රම නොඉක්මවමින් පෙරට වඩා සංස්කෘත භාෂාව ජනප්‍රිය කළ හැකිය. ඒ සඳහා තුළනාත්මක භාෂා අධ්‍යයන විධි ක්‍රමය වඩාත් උචිත වනු ඇත.

නිපුණතා පාදක අධ්‍යාපනය ජාතික අවශ්‍යතාවක් වන බැවින් සංස්කෘත භාෂාවෙන් පෙරටත් වඩා නිපුණයින් බිහි කිරීම අරමුණු කොට ගවේෂණාත්මක ක්‍රියාකාරකම් ඔස්සේ සිසු නිපුණතා ගොඩනැගෙන පරිදි ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කර ඇත.

අතීතයේ සිට පන්ති කාමර තුළ බහුල ව ක්‍රියාත්මක වූ ගුරුවරයාගේ ඉගැන්වීම් ක්‍රම වූ සම්ප්‍රේෂණ ක්‍රමය, (Transmisson Role) ගනුදෙනු ක්‍රමය, (Transaction Role) ඉක්මවා සිසු චින්තනය අවදි කරන, සිසුන්ගේ පෞද්ගලික හා සමාජ කුසලතා සංවර්ධනය කරන පරිණාමන ක්‍රමය (Transformation Role) මෙහි දී ගුරුවරයාගෙන් අපේක්ෂා කෙරේ.

නිපුණතා පාදක අධ්‍යාපනයේ දී ශිෂ්‍ය කාර්යයන් ප්‍රබල ස්ථානයක් ගන්නා අතර පන්තියේ සෑම ළමයකු ම ඒ ඒ නිපුණතා සම්බන්ධ ව අඩු තරමින් ආසන්න ප්‍රවීණතාවට හෝ ගෙන ඒමට මැදිහත් වන සම්පත් දායකයකුගේ තත්ත්වය පරිණාමන ගුරු භූමිකාවෙන් අපේක්ෂා කෙරේ. ඉගෙනුමට අවශ්‍ය උපකරණ හා අනෙකුත් පහසුකම් සහිත ඉගෙනුම් පරිසරයක් සැලසුම් කිරීම, සිසුන් ඉගෙන ගන්නා අයුරු සමීප ව නිරීක්ෂණය කිරීම, ශිෂ්‍ය හැකියා හා නොහැකියා හඳුනාගැනීම, අවශ්‍ය ඉදිරි පෝෂණ හා ප්‍රතිපෝෂණ ලබා දෙමින් සිසුන්ගේ ඉගෙනුම ප්‍රවර්ධනය කිරීම මෙන් ම පන්ති කාමරයෙන් බැහැර ව ඉගෙනුම හා ඉගැන්වීම දීර්ඝ කිරීම සඳහා සුදුසු උපකරණ සකස් කිරීම ද මෙහි දී ගුරුවරයාගෙන් ඉටු විය යුතු මූලික කාර්යයන් වේ.

සංස්කෘත විෂය, අ. පො. ස. (සා. පෙළ) සම්බන්ධයෙන් ගත් විට භාෂා විෂයයක් වන බැවින් භාෂාවන් ඉගෙනීමේ දී භාවිත කළ හැකි නූතන විද්‍යාත්මක ක්‍රම, එනම් ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යය, සමකාලීන ප්‍රකාශන, අන්තර්ජාලය ආදිය ද භාෂා භාවිතයට කෙටි විද්‍යාත්මක ක්‍රම හා තර්කානුකූල ක්‍රම ද යොදා ගත යුතු ය.

## 5.0 පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන් සංවිධානය

සම්භාව්‍ය භාෂාවක් හා ආගමික භාෂාවක් වශයෙන් සංස්කෘත භාෂාව, ශ්‍රී ලංකාවේ අධ්‍යාපන මධ්‍යස්ථානවල පුරාතනයේ සිට අද දක්වා හැදෑරීම, භාවිතය සිදු වේ. තාක්ෂණික අංශයෙන් දියුණු වී විශ්ව ගම්මානයක් වූ ලෝක ප්‍රජාවගේ ශාස්ත්‍රීය හා නිර්මාණාත්මක සංවර්ධනයට පෙරටත් වඩා පරිපූර්ණ දායකත්වයක් සංස්කෘත භාෂාවෙන් ලබා ගත හැකි ය. ජාත්‍යන්තර කීර්තියට පත් ශ්‍රී ලංකික ඇතැම් විද්වතුන් එම තත්ත්වයට පත්වීමේ ප්‍රධාන සාධකය ඔවුන් සතු සංස්කෘත භාෂා නිපුණතාව යි. සංස්කෘත භාෂාව ශාස්ත්‍රීය කටයුතු හා ආගමික කටයුතුවලට පමණක් සීමා නොකොට පාසල් පද්ධතිය තුළින් සමාජයට නව ආරකට හඳුන්වා දිය යුතු කාලය එළඹ ඇත. දැනුම ගවේෂණය කරන ක්‍රියාකාරී පුද්ගලයකු ලෙස පන්ති කාමරයට පමණක් කොටු වී ලබන අධ්‍යාපනයෙන් බැහැර ව පාසල තුළ විවිධ වැඩසටහන් සංවිධානය කළ යුතු යි. පාසල් සංස්කෘතියට ගැළපෙන පරිදි සහ පාසලේ පවත්නා මානව හා භෞතික සම්පත් අනුව විෂය නිර්දේශයේ සඳහන් නිපුණතා සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම වැඩසටහන් සංවිධානය විය යුතු ය.

01. සංස්කෘත භාෂා දින,
02. කණ්ඩායම් සංවාද,
03. මාසික වාර්ෂික සංගම්වල දී සංස්කෘතයෙන් භාෂණය, ගායනය,
04. කෙටි නාට්‍ය සැකසීම, ඉදිරිපත් කිරීම,
05. බිත්ති පුවත්පත් පළ කිරීම,
06. උපදේශාත්මක සංස්කෘත ශ්ලෝක හා තොරතුරු එක් රැස් කිරීම,
07. මව්බසේ වචන පරිණාමය වී ඇති ආකාරය පිළිබඳ සංස්කෘතය ඇසුරින් තොරතුරු රැස් කිරීම ආදි වැඩසටහන් ඒ සඳහා උදාහරණ වේ.

## 6.0 තක්සේරුව හා ඇගයීම

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් උපකරණ නිර්මාණාත්මක ව පිළියෙළ කොට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ය.

ඉගෙනුම් කාර්යයේ දී අපේක්ෂිත නිපුණතා මට්ටමට පැමිණ අත්පත් කර ගෙන ඇති ඉගෙනුම් ඵලයන්ගේ ගුණාත්මක බව සොයා බැලීමට තක්සේරුව හා ඇගයීම අවශ්‍ය වේ.

නිපුණතා මට්ටම් ඔස්සේ අපේක්ෂිත ඉගෙනුම් ඵලවලට ළඟා වන ආකාරය හඳුනාගැනීම තක්සේරුවේ දී සිදු වේ. මුල දී තීරණය කර ගත් නිර්ණායක සමග සසඳා බලමින් අදාළ නිපුණතා කවර මට්ටමකින් ශිෂ්‍යයා සාක්ෂාත් කරගෙන තිබේ දැයි පරීක්ෂා කළ යුතු වේ. ඒ අනුව ප්‍රබලතා දුබලතා හඳුනාගෙන ප්‍රතිපෝෂණ ඉදිරි පෝෂණ වැඩ සටහන් සංවිධාන කළ යුතුය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර දී කණ්ඩායම් ගවේෂණය, ශිෂ්‍ය ක්‍රියාකාරකම් ඉදිරිත් කිරීම යන අවස්ථාවල තක්සේරු කාර්යය මැනවින් කළ හැකි ය.

තක්සේරු කාර්යයට අමතර ව ඇගයීම් වැඩ පිළිවෙළ යනු ශිෂ්‍යයාගේ ප්‍රවීණතා මට්ටම තීරණය කිරීම ය. ප්‍රවීණතා මට්ටම විනිශ්චයේ දී සිසුන් හිමි කරගත් ශ්‍රේණි, ලකුණු ආදිය සසඳා ඔවුන්ගේ ප්‍රගතිය සොයා බැලිය යුතු ය.

## අ.පො.ස (සාමාන්‍ය පෙළ) සංස්කෘත විෂය නිර්දේශය

## සම්පාදක මණ්ඩලය 2012

| | | |
|---|---|---|
| **මාර්ගෝපදේශය** | - | මහාචාර්ය ඩබ්ලිව්.එම්. අබේරත්න බණ්ඩාර<br>අධ්‍යක්ෂ ජනරාල්<br>ජාතික අධ්‍යාපන ආයතනය |
| **සම්බන්ධීකරණය** | - | රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති<br>පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි<br>සහකාර ව්‍යාපෘති නිලධාරි<br>ජාතික අධ්‍යාපන ආයතනය |

**සම්පත් දායකත්වය**

01. මහාචාර්ය පූජ්‍ය ඉඳුරාගාරේ ධම්මරතන හිමි
අංශාධිපති - සංස්කෘත අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය

02. පූජ්‍ය උළුවිටිකේ සෝමරතන හිමි
(ශාස්ත්‍රපති, පණ්ඩිත, අධ්‍යාපන ඩිප්ලෝමා) - සංස්කෘත ගුරු උපදේශක
ශ්‍රී ප්‍රියරත්න පිරිවෙණ, බෝපේ - ගාල්ල

03. පූජ්‍ය මිල්ලෑවේ සරණපාල හිමි
(රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, අධ්‍යාපන ඩිප්ලෝමා)
සහකාර අධ්‍යාපන අධ්‍යක්‍ෂ (පිරිවෙන්), ඉසුරුපාය - බත්තරමුල්ල

04. පූජ්‍ය විදුරපොල ආනන්ද හිමි
(රාජකීය පණ්ඩිත, ගෞරව ශාස්ත්‍රවේදී, අධ්‍යාපන ඩිප්ලෝමා)
මොල්ලිගොඩ ප්‍රවචනෝදය මහ පිරිවෙණ, වාද්දුව

05 පූජ්‍ය අබේසේකරගම විජිත හිමි
(ගෞරව ශාස්ත්‍රවේදී) - පරිවෙණාචාර්ය
ශ්‍රී රේවත විද්‍යායතන පිරිවෙණ, කුඹල්වැල්ල, ගාල්ල

06 සුනිල් දම්මුල්ල ගමගේ, (ගෞරව ශාස්ත්‍රවේදී) - පරිවෙණාචාර්ය
ශ්‍රී විජයානන්ද පිරිවෙණ, හබරකඩ

07 වර්ණකුලසූරිය සනත් ප්‍රියශාන්ත - (පණ්ඩිත, ශාස්ත්‍රවේදී, ත්‍රිපිටකවේදී)
පරිවෙණාචාර්ය, සුභද්‍රාරාම විද්‍යායතන පිරිවෙණ
ගංගොඩවිල, නුගේගොඩ